# මධ්‍යම පළාත් කලා උළෙල -2024

## මධ්‍යම පළාත් කලායතන නර්තන තරඟ

මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරනු ලබන මධ්‍යම පළාත් කලා උළෙල - 2024 ට සමගාමීව අන්තර් කලායතන නර්තන හා හේවිවාදන තරඟ සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. අයදුම් කිරීම :-**

මේ සමග ඇති ආදර්ශ අයදුම්පත අනුව ඉදිරිපත්වන තරග අංශ සඳහන් කර 2024-05-15 ට පෙර තමන්ගේ ස්ථිර පදිංචියට අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංස්කෘතික නිලධාරී වෙත පිටපත් 02කින් භාර දිය යුතු වේ.

ප්‍රාදේශීය මට්ටමේ තරග සඳහා ඉදිරිපත් වීමේ දී තරග කිරීමට ප්‍රමාණවත් කලායතන නොමැතිනම් එම කලායතන පළාත් තරගයට සහභාගි කළ යුතුය.

**2. තරඟ පැවැත්වීම :-**

i කලායතන මට්ටම

ii. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටම

iii. පළාත් මට්ටම

**3. තරඟ කාල සටහන :-**

i. අයදුම්පත් කැඳවීම 2024 අප්‍රේල් මස 20 වන දින සිට මැයි මස 15වන දින දක්වා

ii. කලායතන මට්ටමේ තරග ජූනි මස 01 වන දින ට පෙර අවසන් කළ යුතුය.

iii. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමේ තරග ජූනි මස 30 වන දිනට අවසන් කර ජූලි මස 10 වන දිනට පෙර සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතුය.

iv. පළාත් මට්ටමේ තරඟ 2024 ජූලි මස 20වන දින සිට අගෝස්තු මස 15 වන දින දක්වා කාලය තුළ පැවැත්වීමට අපේක්ෂා කෙරේ.

v. මධ්‍යම පළාත් කලා උළෙල 2024 වසරේ ඔක්තෝම්බර් මස පැවැත්වීමට නියමිතය

**4. නර්තන තරග ශීර්ෂ ( තරග ශීර්ෂ 04ක් යටතේ පැවැත්වේ. )**

1. කණිෂ්ඨ අංශය ළමා නර්තන තරගය - සමූහ මිශ්‍ර

2.. නව නිර්මාණ නර්තන තරගය - සමූහ මිශ්‍ර

3. සාම්ප්‍රදායික නර්තන තරගය - සමූහ මිශ්‍ර

4. බෙර වාදන තරඟය ( බෙර සංධ්වනිය ) - සමූහ මිශ්‍ර

**1. කණිෂ්ඨ අංශය ළමා නර්තන - සමූහ මිශ්‍ර**

i. කාන්තා පිරිමි දෙපිරිසට ම සහභාගි විය හැකි අතර මිශ්‍ර තරගයක් ලෙස විනිශ්චය කෙරේ.
ii. වයස් සීමාව අවු 5.-12 අතර වේ.
iii. පටිගත කරන ලද සංගීතය භාවිතා කළ නොහැක.
iv. අදාල නිර්මාණයට උචිත ලෙස ඇඳුම් පැළඳුම් සකස් කර ගත යුතුය.
v. නර්තනයට යොදා ගන්නා කාලය විනාඩි 06ත් 07ත් අතර විය යුතුය.
vi. සහභාගි විය හැකි උපරිම සංඛ්‍යාව වාදනය ද සමග 20 කි.
**vii.** එළුවන් කැම ඇසුරින් නර්තනය නිර්මාණය කර ගත යුතු වේ.

**2. නව නිර්මාණ නර්තන තරගය - සමූහ මිශ්‍ර**

i. නව නිර්මාණ නැටුම් සඳහා රංග වස්ත්‍රාභරණ උචිත ලෙස නිර්මාණය කර ගත හැකිය.
ii. පසුබිම් වාදනය නිර්මාණයට උචිත පරිදි යොදා ගත හැකිය. නමුත් පටිගත කළ සංගීතය භාවිතා කළ නොහැකිය.
iii. නර්තනයට යොදා ගන්නා කාලය විනාඩි 06 ත් 08 ත් අතර විය යුතුය.
iv. සහභාගි විය හැකි උපරිම සංඛ්‍යාව වාදනය සමග 20 කි.
v. මිශ්‍ර තරඟයක් ලෙස විනිශ්චය කරනු ලැබේ. කාන්තා පිරිමි දෙඅංශයටම සහභාගි විය හැකිය.
vi. වයස් සීමාව අවු. 12 - 20 අතර වේ.
vii. **ඔබ විසින්ම නිර්මාණය කළ නවතම වත්තමක් ඇසුරින්** නර්තන අංගය නිර්මාණය කරගත යුතුය.

**3. සාම්ප්‍රදායික නර්තන තරගය- සමූහ** මිශ්‍ර

i. මෙම තරගය සඳහා සාම්ප්‍රදායික රංග වස්ත්‍රාභරණ යොදා ගැනීම අත්‍යවශ්‍යය වේ.
ii. නර්තනයට යොදාගත යුතු .කාලය විනාඩි 06ත් 08 ත් අතර විය යුතුය.
iii. සහභාගි විය හැකි උපරිම සංඛ්‍යාව වාදනයද සමග 25 කි.
iv. මිශ්‍ර තරඟයක් ලෙස විනිශ්චය කරනු ලැබේ. කාන්තා පිරිමි දෙඅංශයටම සහභාගි විය හැකිය.
v. පසුබිම් ගායනා සහ වාදනය සම්ප්‍රදායට උචිත විය යුතුය.
vi. වයස් සීමාව අවු. 12 - 20 අතර වේ.
vii. කොහොඹාහැල්ල ඇසුරින් නර්තන අංගය නිර්මාණය කරගත යුතුය.

**4. සමූහ බෙර වාදන තරඟ ( බෙර සංධවනිය ) මිශ්‍ර**

i. කාන්තා පිරිමි දෙඅංශයටම ඉදිරිපත් විය හැකිය. මිශ්‍ර තරගයක් ලෙස විනිශ්චය කෙරේ.
ii. දේශීය තූර්ය වාදන භාණ්ඩ වලට අමතරව බට නලාව යොදාගත හැකිය.
iii. කාලය විනාඩි 06 -08ත් අතර විය යුතුය.
iv. සහභාගි විය හැකි උපරිම සංඛ්‍යාව 20 කි.
v. මේ තරඟ අංශය සඳහා රංග වස්ත්‍රාභරණ සුදුසු පරිදි සකස් කර ගත යුතුය.
vi. ශිල්පීය දක්ෂතා ඉස්මතුවන පරිදි නිර්මාණාත්මක වාදනයක් අපේක්ෂා කෙරේ.

**5. පොදු තරඟ කොන්දේසි:**

I මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ක්‍රියාකාරී කලායතන පමණක් මේ සඳහා ඉදිරිපත් වීමට අවස්ථාව ඇත.

ii එක් එක් තරඟ අංගයන් සඳහා **එකම අයදුම්පතේ වෙන් වෙන් වශයෙන්** තරග සඳහා අයදුම් කළ යුතු අතර අපැහැදිලි හා අසම්පූර්ණ අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කෙරේ

iii එක් කලායතනයකට ඉදිරිපත් විය හැකි **උපරිම තරඟ අංග සංඛ්‍යාව 03 ක් පමණක් වන අතර අවම වශයෙන් එක් තරගයකටවත් ඉදිරිපත් විය යුතුය.**

iv ඉදිරිපත්වන සියළුම තරගකරුවන් /තරගකාරියන් 2024-08-15වන දිනට අවු. 20 හෝ ඊට අඩු විය යුතුය.

v සහය බෙර වාදන සඳහා බාහිර ශිල්පීන් යොදා ගැනීමට හැකියාවක් නොමැති අතර කලායතනයේ ලියාපදිංචි ගුරු ශිෂ්‍ය දෙපිරිසටම වාදනය සඳහා සහභාගි විය හැකිය.

vi සියලුම තරග මිශ්‍ර තරග ලෙස පවත්වනු ලැබේ. තරග අංශය සඳහා නියමිත සංඛ්‍යාවෙන් තුනෙන් එකක්වත් කාන්තා හෝ පිරිමි නියෝජනය විය යුතුය.

vii නර්තන හා වාදන තරග අංග සඳහා කාලය අවමය විනාඩි 06 කි. උපරිමය විනාඩි 08ක් වන අතර එම කාලය ඉක්මවා නොයැමට නර්තනය සකස් කර ගත යුතු වේ.

viii තරග සඳහා ඉදිරිපත් වන සෑම අවස්ථාවකදීම ජාතික හැඳුනුම්පත, තැපැල් හැඳුනුම්පත හෝ උප්පැන්න සහතිකය අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතුය. අදාල නාම ලේඛන උප්පැන්න සහතික උපන් දින හා හැඳුනුම්පත් අංක නිවැරදි බවට අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංස්කෘතික නිලධාරි පෞද්ගලිකව පරීක්ෂා කර සහතික කළ යුතුය.

ix. ප්‍රාදේශීය කලායතන තරග සඳහා ඉදිරිපත් කරන ශිල්පීන්ගේ නාම ලේඛනය පළාත් තරග පැවැත්වෙන අවස්ථාවේදී යම් ආකාරයකින් වෙනස් වන්නේ නම් අදාල කොට්ඨාසයේ සංස්කෘතික නිලධාරි මගින් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව දැනුවත් කළ යුතුය.

x. ප්‍රාදේශීය මට්ටමින් ඉදිරිපත් කරන නාම ලේඛනයට අයත් තරගකරුවන්ට පමණක් සහතික හිමි වේ. මේ සම්බන්ධ වගකීම අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සංස්කෘතික නිලධාරි සතුය. ඒ අනුව සංස්කෘතික නිලධාරියා විසින් පරීක්ෂා කර නාම ලේඛන පිටපත් දෙකක් ලබාගෙන එක් පිටපතක් තමා තබාගෙන අනෙක් පිටපත සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතුය. එමෙන්ම මෙම අයදුම්පත් ඉදිරිපත් කරන අවස්ථාවේ නර්තන සඳහා සහභාගිවන ශිල්පීන්ගේ නාම ලේඛනය ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

**6. ප්‍රාදේශීය මට්ටමේ තරඟ**

i. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමේ තරග සඳහා කලායතන මට්ටමේ තරග වලින් ප්‍රථම ස්ථානය ලබාගත් නිර්මාණ ඉදිරිපත් කළ යුතුය. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමේ කලායතන තරග සුදුසුකම් ඇති විනිශ්චය මණ්ඩලයක සහභාගිත්වයෙන් පැවැත්විය යුතුය.

ii. ප්‍රාදේශීය මට්ටමින් ප්‍රථම ස්ථානය ලබා ගන්නා තරග අංග සඳහා සහතිකපත්, මුදල් ත්‍යාගයක් ලබා දෙන අතර දෙවන, තෙවන ස්ථානය සඳහා සහතිකපත් පමණක් ලබා දීමට කටයුතු කරනු ලැබේ.

iii. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමේ තරග සඳහා තරග නොකොට පළාත් තරග සඳහා (නිතරගයෙන්) ඉදිරිපත් වන කලායතන වලට ප්‍රාදේශීය මට්ටමේ ප්‍රථම ස්ථානයට හිමි වන ත්‍යාග මුදල් හිමි නොවේ. එබැවින් ප්‍රාදේශීය මට්ටමේ කලායතන තරග පැවැත්වීමේදී තරග අංග ගැටෙන ආකාරයට තරග සඳහා ඉදිරිපත් විය යුතු බවට කලායතන දැනුවත් කිරීමට අදාල සංස්කෘතික නිලධාරීන් කටයුතු කළ යුතු වේ.

iv. තරග පැවැත්වීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමේදී නිතරගයෙන් ඉදිරිපත්වන කොට්ඨාසවලට මූල්‍ය ප්‍රතිපාදන වෙන් කරනු නොලැබේ.

v. ප්‍රාදේශීය මට්ටමේ තරග පැවැත්වීමේදී රංගවස්ත්‍ර පිළිබඳ අවධානය යොමු නොකරන බැවින් පුහුණු ඇඳුමින් තරග සඳහා සහභාගිවීමට අවස්ථාව ඇත.

**7. පළාත් මට්ටමේ තරග**

i. පළාත් තරග සඳහා ඉදිරිපත් විය හැකි වනුයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමේදී ප්‍රථම ස්ථාන ලබා ගන්නා කලායතනවලට හා නිතරගයෙන් පළාත් තරග සඳහා ඉදිරිපත් වන කලායතන සඳහා පමණි.

ii. මෙම දෙපාර්තමේන්තුව මගින් අවස්ථාවෝචිතව එක් ස්ථානයකදී හෝ ස්ථාන කිහිපයකදී පළාත් තරග පැවැත්වීමට විධිවිධාන යොදනු ඇත.

iii. මෙම දෙපාර්තමේන්තුව මගින් සුදුසු ප්‍රවීණ විනිශ්චය මණ්ඩලයක් සහභාගි කර ගනිමින් පළාත් මට්ටමේ තරග පවත්වනු ලැබේ.

iv. පළාත් තරග සඳහා සහභාගි වීමේදී නර්තනය හා වාදනයට සුදුසු වස්ත්‍රාභරණයෙන් ඉදිරිපත් විය යුතුය.

**8. ජයග්‍රාහිකයින් ඇගයීම**

i. ප්‍රථම, දෙවන හා තෙවන සහ කුසලතා ස්ථාන දිනා ගන්නා නිර්මාණවලට එම නිර්මාණ ඉදිරිපත් කළ කලායතන සඳහා මුදල් ත්‍යාගද, ඉදිරිපත්වන ශිල්පීන් සඳහා සහතික පත්‍ර ද පිරිනැමීමට කටයුතු කරනු ලැබේ.

ii. **ප්‍රථම ස්ථානය දිනාගන්නා ජයග්‍රාහී නිර්මාණ වලින් කලා උළෙල සඳහා සුදුසු නිර්මාණ ඉදිරිපත් කිරීමට අවස්ථාව ඇති අතර එය එදින උත්සවයේ වැඩසටහන මත පළාත් සංස්කෘතික අධ්‍යක්ෂකගේ** එකඟතාවය මත තීරණය වේ.

iii. කලායතන නර්තන තරග සඳහා අයදුම්පත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත භාර ගන්නා අවසන් දිනය 2024-05 -20 වන දින බව සැලකිය යුතුය. මෙම තරග පිළිබඳ විස්තර පහත සඳහන් ලිපිනයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්ත පළාත් සංස්කෘතික නිලධාරීන්ගෙන් ලබා ගත හැකිවන අතර මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ( central province ) මුහුණු පොත ( face book ) හා www.culture.cp.gov.lk යන මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය මගින් ද ලබාගත හැකි බව කාරුණිකව සලකන්න

**09. ඉල්ලුම්පත් යොමු කිරීම:**

සියලුම කලායතන අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කර අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පළාත් සංස්කෘතික නිලධාරීන් වෙත 2024. 05. 15 දිනට පෙර භාරදිය යුතු බව කරුණාවෙන් සලකන්න.

විමසීම් :- සංස්කෘතික නිලධාරී- මල්ලිකා තෙන්නකෝන්

081- 2238476

ටී.එම්. ඉනෝදනී තඹවිට
පළාත් අධ්‍යක්ෂ,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
,මහනුවර

**මධ්‍යම පළාත් කලා උළෙල - 2024**

**<u>කලායතන නර්තන තරඟ අයදුම්පත්‍රය</u>**

දිස්ත්‍රික්කය: [ ] ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය [ ]

1. කලායතනයේ නම :- ..............................................................................

2. කලායතනාධිපතිගේ නම :- ..............................................................................

   i. කලායතනාධිපතිගේ ලිපිනය :- ..............................................................................

   ..............................................................................

   ii. දුරකථන අංකය :- ..............................................................................

3. මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ කලායතනය ලියාපදිංචි අංකය: [ ]

4. තරගය සඳහා ඉදිරිපත්වන නිර්මාණයේ නම : අදාල කොටුවේ ✓ ලකුණ යොදන්න.

| අනු අංකය | නර්තන අංගය | ඉදිරිපත්වන තරග අංශ |
|---|---|---|
| 01. | ළමා නර්තන තරගය - සමූහ මිශ්‍ර | |
| 02. | නව නිර්මාණ නර්තන තරගය - සමූහ මිශ්‍ර | |
| 03. | සාම්ප්‍රදායික නර්තන තරගය - සමූහ මිශ්‍ර | |
| 04. | සමූහ බෙර වාදන තරඟ ( බෙර සංධවනිය ) - සමූහ මිශ්‍ර | |

05. ශිල්පීන් සංඛ්‍යාව: .................................. (ශිල්පීන්ගේ සහතික කළ නාම ලේඛනය අමුණන්න)

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ඉදිරිපත් කරනු ලබන නර්තනය මාගේ කලායතනයේම නිර්මාණයක් බවට සහතික කරන අතර තරඟයේ සියළුම කොන්දේසි හා නීති රීතිවලට අනුකූලව කටයුතු කිරීමට එකඟ වන බවත් විනිශ්වය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය බවත් පිළිගනිමි.

.......................................................... ..........................................................

දිනය කලායතනාධිපතිගේ අත්සන හා නිල මුද්‍රාව

---

කලායතනාධිපති විසින් ඉදිරිපත් කර ඉහත සඳහන් තොරතුරු නිර්දේශ කර අවශ්‍ය කටයුතු සඳහා යොමු කරමි.

.......................................................... ..........................................................

දිනය සංස්කෘතික නිලධාරිගේ අත්සන හා නිල මුද්‍රාව

ප්‍රාදේශීය මට්ටමේ කලායතන නර්තන තරග 2024 සඳහා
<u>ඉදිරිපත් වන සිසු සිසුවියන්ගේ නාම ලේඛනය</u>

දිස්ත්‍රික්කය:- [ ] කොට්ඨාසය:- [ ]

1.කලායතනයේ නම සහ ලිපිනය:- ..............................................................................................

..............................................................................................

2. ඉදිරිපත් වන නර්තනය:- ..............................................................................................

| අනු අංකය | නර්තනයට ඉදිරිපත් වන අයගේ මුලකුරු සමග නම | උපන් දිනය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |
| 5 | | |
| 6 | | |
| 7 | | |
| 8 | | |
| 9 | | |
| 10 | | |
| 11 | | |
| 12 | | |
| 13 | | |
| 14 | | |
| 15 | | |
| 16 | | |
| 17 | | |
| 18 | | |
| 19 | | |
| 20 | | |
| 21 | | |
| 22 | | |
| 23 | | |
| 24. | | |
| 25 | | |
| | සහභාගී වන මුළු සංඛ්‍යාව | |

දිනය..........................................

..............................................................
කලායතනාධිපතිගේ අත්සන
නිල මුද්‍රාව

3. පළාත් සංස්කෘතික නිලධාරීගේ නිර්දේශය :-

ඉහත සඳහන් නාම ලේඛනය හා උපන් දින පරීක්ෂා කළ අතර උපන් දින හා නාම ලේඛනය නිවැරදි බවත් එම සිසු/සිසුවියන් එම කලායතනයේම ඉගෙනුම ලබන බවත් සහතික කරමි.

..........................................
දිනය

..............................................................
සංස්කෘතික නිලධාරීගේ අත්සන හා
නිල මුද්‍රාව

මධ්‍යම පළාත් අන්තර් කලායතන තරග පැවැත්වීම -2024 දළ වියදම් ඇස්තමේන්තුව

| අනු අංකය | කාරණය | අපේක්ෂිත මුදල |
|---|---|---|
| 01. | ප්‍රාදේශීය කලායතන තරග ප්‍රතිපාදන යැවීම ( රු.10 000.00 x 36 ) | රු. 3 00000. 00 |
| 02. | පළාත් තරග පැවැත්වීම මහනුවර, මාතලේ, නුවරඑළිය (නර්තන,සංගීත) | රු 2 00000. 00 |
| 03. | ත්‍යාග සඳහා ප්‍රාදේශීය ප්‍රථම ස්ථාන ( රු.5 000.00 x 2 = රු.10 000.00 x 36 ) | රු. 3 60000. 00 |
| 04. | පළාත් තරග ප්‍රථම ස්ථාන ( රු.15 000.00 x 3 ) | රු. 45 000.00 |
| 05. | පළාත් තරග දෙවන ස්ථාන ( රු.12 000.00 x 3 ) | රු. 36 000.00 |
| 06. | පළාත් තරග තෙවන ස්ථාන ( රු.10 000.00 x 3 ) | රු 30 000.00 |
| 07. | පළාත් තරග 4,5,6,7ස්ථාන ( රු.5 000.00 x 4) | රු. 20 000.00 |
| 08. | සහතිකපත් මුද්‍රණය සඳහා | රු. 50 000.00 |
| 09. | ඉන්ධන සහ වෙනත් | රු. 20 000.00 |
| **10.** | **මුළු වියදම** | **රු. 10 61000.00** |

සම්බන්ධීකරණය - විෂය භාර නිලධාරි

අධීක්ෂණය - පළාත් අධ්‍යක්ෂ

සකස් කලේ

---------------------------

මල්ලිකා තෙන්නකෝන්
සංස්කෘතික නිලධාරි

පරීක්ෂා කලේ

----------------------

බී.ඩබ්. බණ්ඩාර
සංස්කෘතික නිලධාරි

අනුමත කරමි/නොකරමි

.......................................................................................

ටී.එම්. ඉනෝදනී තඹවිට
පළාත් අධ්‍යක්ෂ,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
මහනුවර